# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIX YEAR OF OUR LORD JESUS CHRIST, 2025 SEPTEMBER Issue No. 10


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 81:1-8)**

01. අපේ ශක්තියවූ දෙවියන්වහන්සේට උස්වූ ශබ්ද නගා ගී කියව්. යාකොබ්ගේ දෙවියන්වහන්සේට ප්‍රීතිනාද පවත්වව්..

02. ගීතිකා පටන්ගෙන, රබානත් මිහිරි වීණාව සහ කුඩා වීණාවත් ගෙනෙව්

03. අමාවක දවසේදීද පුරා හඳ දවසේදීද අපේ මහා මංගල්‍ය දවසේදීද හොරණෑව පිඹිව්.

04. මක්නිසාද එය ඉශ්‍රායෙල්ට නියෝගයක්ය, යාකොබ්ගේ දෙවියන්වහන්සේගේ පනතක්ය.

05. මා විසින් නොදත් භාෂාවක් ඇසුවාවූ මිසර දේශයෙහි උන්වහන්සේ ගිය කල, මෙය යෝසෙප්ට සාක්ෂියක් කොට නියමකළසේක

06. ඔහුගේ කර බරෙන් නිදහස් කෙළෙමි. කූඩා ඇදීමෙන් ඔහුගේ අත් මිදුණේය.

07. විපතේදී ඔබ අඬගැසුවෙහිය, මම ඔබ මිදුවෙමි; ගර්ජනාවේ රහස් තැනදී ඔබට උත්තර දුනිමි; මෙරිබාහි වතුර ළඟදී ඔබ පරීක්ෂා කෙළෙමි.

08. මාගේ සෙනගෙනි, අසව්, මම ඔබ සැමට සාක්ෂිදෙන්නෙමි; අහෝ, ඉශ්‍රායෙල්, මට ඇහුම්කන් දෙන්නෙහි නම් යහපත!

## ඔබගේ අමාරුම අවස්ථාවන්වලදී ස්ථීරව හා ධෛර්යමත්ව සිටින්න.

**HOLD FAST & BE COURAGEOUS EVEN IN HARD TIMES!**

*Sis. Angel*



***කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ සාමාජිකයිනි,***

අපගේ ස්වාමි වූ යේසුස්වහන්සේගේ නාමයෙන් අප ඔබට සුභ පතමු.

උන්වහන්සේ සියලු බලයෙන් පූර්ණව සර්වබලධාරී දෙවි පියාණන්වහන්සේව සිටින නිසා උන්වහන්සේට ඔබගේ ජීවිතයේ මහත් දේවල් කළ හැකිය. එබැවින් ඔබගේ ආත්මය සඵල වන ආකාරයෙන්ම ඔබ සැම දේ තුළින්ම සඵලවත් වී සිටිනවාය කියා විශ්වාස කරමි.

දින කීපයකට පෙර මා දානියෙල් පොතෙහි 3 වන පරිච්ඡේදය කියවමින් සිටියෙමි. මෙම පරිච්ඡේදය මා කීප වතාවක් කියවා තිබුණද මේ වතාවේදී මා කියවන විට මට ඉතා මහත් පහසුවක් දැනුණි. ඒ දේ මා ඔබ සමග බෙදා ගැනීමට කැමැත්තෙමි.

### හෙබ්‍රෙව් සහෝදරයෝ

දානියෙල් 3 වන පරිච්ඡේදය ආරම්භ වන්නේ හෙබ්‍රෙව් මනුෂ්‍යයන් වන ශද්‍රක්, මේෂාක් සහ අබෙද් නේගෝ යන තුන්දෙනාට නෙබුකද්නෙෂර් රජතුමා විසින් සෑදූ රන් රූපය ඉදිරියේදී නමස්කාර කිරීම අනිවාර්යය කියා නීතියක් දමා තිබුණේය. නැතිනම් ඇවිලෙන්නෙ ගිනි උදුනට ඔවුන්ව හෙලන්නට අණ කළේය.

3 වෙනි පිටුවට ...




**Echo of His Call**

*Christian YouTube Channel!*

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**

Every day – From 2.00 A.M.

**Tamil Sunday Service – 8.30 A.M.**

* Please Subscribe and Share *

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

## *from your dearly beloved brother...*



REACHING NATIONS



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


**HON. EDITOR-IN-CHIEF**

Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.

**EX MANAGING EDITOR**

Pastor Alex Samson Sam, B.Th., M.Div.

**GENERAL MANAGER**

Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.

**ADMINISTRATION**

Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

**EDITORIAL BOARD**

Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

**EDITOR, PUBLISHER & PRINTER**

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858

**E.MAIL**

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**

www.echoofhiscall.org
www.stpaulsmatriculation.org

**YOUTUBE CHANNEL**

Echo of His Call


**... You shall do what is right and good in the sight of the LORD that it may be well with you. - Deuteronomy 6:18.**

**ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රිය සහෝදරයා සහෝදරිය,**

ප්‍රිය මිත්‍රවරුනි, මගේ සේවය සමඟද මා සමඟ ද සිටගෙන යාච්ඤා කරමින් වෙහෙස මහන්සි වී උපකාර කළා වූද මූල්‍යමය අතින්ද උපකාර කළාවූ සියලුම සහෝදර සහෝදරියන්ට මගේ හෘදයාංගයෙම ස්තුතිය පුදකිරීමට කැමැත්තෙමි.

ඔබ සියලු දෙනාම දෙවියන් වහන්සේ මට දුන්නා වූ සෙනගක්ය කියා මා සිතමි. දිනපතා අපගේ ජීවිතයට පැමිණෙන අභියෝග, ප්‍රශ්න යන මේ සියල්ල තුළ දෙවියන් වහන්සේට සේවය කිරීමට උන්වහන්සේ අපට දී තිබෙන අනුග්‍රහය ගැන මා උන්වහන්සේට ස්තුති කරමි. පසුගිය කාල වකවානුව තුළදී උන්වහන්සේ කළාවූ සෑම දේ දෙස බලන විට එක දෙයක් මා දනිමි. එනම්; උන්වහන්සේ කිසි දිනෙක අපව ලැජ්ජාවට පත් නොකළ බවයි. ගීතාවලිය 119:31හි මෙසේ පවසයි; *''ඔබගේ ශික්ෂාවලට ඇලුම් වෙමි. ස්වාමීනි මා ලැජ්ජාවට නොපැමිණ වුව මැනව.''*

මෙහිදී 'ඇලුම්වෙනවා'ය යන්නෙන් අදහස් කරන්නේ එය තදින් අල්ලා ගැනීමයි. එසේත් නොමැති නම් 'ස්ථිරව සිටිනවා'ය යන අර්ථයෙන් ගෙන දෙයි. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනගට අණ දුන් කල්හි උන්වහන්සේ පැවසූ එක් කාරණයක් නම්; උන්වහන්සේගේ අණ තදින් අල්ලා ගන්න කියාය. එනම් දේව වචනය තුළ ස්ථිරව සිටින්නය කියාය. දෙවියන් වහන්සේ අපට දුන් ඉලක්කය කරා අපට ගමන් කිරීමට හැකි වන්නේ ස්වාමීන් වහන්සේගේ කාරණාවල අප නොසැලී කැපවී සිටියහොත් පමණයි.

මගේ ජීවිතයේ යෞවන කාලයේ සිටම මා පුද්ගලිකව දෙවියන් වහන්සේට ඇලුම්ව සිටියෙමි. එමනිසා මගේ ජීවිතයේ ආත්මික සඵලත්වයත් සියලු ආකාර පහසුකමත් උන්වහන්සේ සපයා දී තිබේ. තවද උන්වහන්සේට ඇලුම් වී උන්වහන්සේගේ කාරණාවන් වලදී මා ස්ථිරව සිටියෙමි. මා ඔබගෙන්ද මෙය ඉල්ලා සිටිමි.

මෙය වචනයට පමණක් සීමා නොවූ ආත්මික අත්දැකීමකි. අපගේ ජීවිතයේ ඇතිවන්නා වූ සියලු කුණාටු, පරාජිත තත්ත්වයන්, තනිකම, සෞඛ්‍යමය ගැටලු, වේදනාවන් හා පරීක්ෂා වැනි මේ සෑම දේ තුළදීම අප නිතරම දෙවියන් වහන්සේ සමග සම්බන්ධතාවය පවත්වාගෙන සිටින්නේ නම්, අපට සැබවින්ම මහත් වූ දේ අත්දැකීමට පුළුවනි. අපගේ ජීවිතය ස්වාමීන් වහන්සේ සමඟ සම්බන්ධතාවය තබාගෙන උන්වහන්සේට ඇලුම් වී උන්වහන්සේ තුළ ස්ථිරව සිටීමට කැපවිය යුතුයි.

අපගේ ජීවිතය ගොඩනගා තිබෙන්නේ වැලි මත නොව පර්වතයක් මතයි. බයිබලයෙහි සඳහන් කර තිබෙන ආකාරයට අද සියලුම දේ අපගේ ජීවිතයෙහි සිදුවෙයි. යේසුස්වහන්සේ ජීවමානයි. උන්වහන්සේ අදත් ක්‍රියා කරමින් සිටී. අපගේ ජීවිතය තුළ අප කුමන ආකාර ගැටලුවලට මුහුණ දෙනු ලැබුවත් දේව වචනය තුළ අපට ජය නියතය.

*''එහෙත් නුඹලාගේ දෙවි වූ ස්වාමීන්වහන්සේට ඇලුම්ව සිටි නුඹලා සියල්ලෝම අද දවසේ ජීවත්ව සිටිති.'' (ද්වීතිය කතාව 4:4)* අපිද ස්වාමීන්වහන්සේට ඇලුම්ව ස්ථිරව සිටිමු.

අපගේ නොසැලෙන ඇදහිල්ල සියලු සෝදිසි වලින් අපට ජයග්‍රහණය ගෙන දෙයි. මෙවැනි කැපවීමකට දේව බය තුළින් අපගේ ජීවිතය මුල් ඇද තිබිය යුතුය.

සියලුම දෙනා උදෙසාම මා යාච්ඤා කරමි. ඔබගේ ජීවිතයේ ඉතිරිව ඇති කාලය තුළදී උන්වහන්සේ ඵල දැරීමට සලස්වයි. ස්වාමීන්වහන්සේ කරුණාව ඔබ සමග තබයි. සහෝදරවරුනි, අප උදෙසා ද යාච්ඤා කරන්න.

*In Christ Jesus, your servant,*

**Pr. S. Sam Selva Raj.**

E.mail : sam@echoofhiscall.org


Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ☼ BIBLECOR - Postal Courses (3 languages) ☼ YouTube Ministry ☼ Online Courses ☼ Theological Correspondence Courses (2 languages) ☼ Church Planting ☼ Nehemiah Bible Colleges ☼ Gospel Printing Press ☼ Great Commission Partners ☼ St. Paul's Matriculation School ☼ Crusades ☼ Community Development

*1 පිටුවෙන්....*

අප මෙම 3 වන පරිච්ඡේදය කියවීමට ප්‍රථම 2 වන පරිච්ඡේදයද කියැවිය යුතුය. එහි සඳහන් කරනු ලබන්නේ ඔහුව කැලඹීමට පත් කරන සිහිනයක් දුටු බවයි.

*''ඒ රූපයේ හිස අනර්ඝ රත්රන්ව, ඒකේ ළය සහ අත් රිදීව, ඒකේ බඩ සහ කලවා පිත්තලව, ඒකේ කෙන්ඩා යකඩව, ඒකේ පාදවලින් කොටසක් යකඩව කොටසක් මැටිව තිබුණේය.'' (දානියෙල් 2:31-33)*



**King Nebuchadnezzar has a troubling dream**

රජතුමා දානියෙල්ට කතාකර එම සිහිනය තේරුම් කරන දෙන්නේ කියා පැවසීය. දානියෙල් එය රජතුමාට තේරුම් කරමින් පවසනු ලැබූයේ; *''......රත්රන් හිස නම් ඔබය. ඔබට පසුව ඔබට වඩා පහත් වූ වෙන රාජ්‍යයක්ද ඉන්පසු මුළු පොළොව කෙරෙහි ආණ්ඩු කරන්නා වූ පිත්තල වැනි වූ තුන්වෙනි රාජ්‍යයද නැගී එන්නාහ." (දානියෙල් 2:38- 39)*

මෙහිදී 2 වන පරිච්ඡේදය සහ 3 වන පරිච්ඡේදය අතර තිබූ කාලසීමාව අපට පැහැදිලිව පවසා නොමැත. නමුත් රජතුමා තමා ඉක්මනින් මැරෙයි කියාත් මට පසුව තව කෙනෙක් රජ කරයි කියාත් සිතන්නට ඇත. එම නිසා සෙනඟට නිතරම මා සිහිවන පිණිස රන් රූපයක් සාදන්න කියා පවසන්නට ඇත. ඔහු තුළ තිබූ උඩඟුකම නිසා ඔහු විශාල රන් රූපයක් සෑදුවේය. සමහර විට එම රූපය ඔහුගේම රූපය වන්නටද ඇත. රටේ සියලු දෙනා එම රන් රූපයට නමස්කාර කළ යුතු බවට ඔහු අණ කරනු ලැබුවේය.

## 1). ඔවුන්ගේ නිදහස උදුරාගත්තා !

*''එකල ඔවුහු ඒ මනුෂ්‍යයන් ඔවුන්ගේ පොරෝනද සැට්ටද සළුද වෙනත් වස්ත්‍රද පිටින් බැඳ ඇවිලෙන ගිනි උඳුන මැදට හෙලූහ." (දානියෙල් 3:21)*

මෙම තරුණයින්ගේ අත් සියල්ලම බැඳ දැමූ මොහොතේදී ඔවුන්ගේ නිදහස නැති කළ විට ඔවුන්ව ගිනි උදුනට දමන්ට යන විට ඔවුන් හැරී එම එම රූපයට නමස්කාර කරයි කියා රජතුමා සිතුවේය.

දෙවියන්වහන්සේගේ සැලැස්ම ඔහුට සම්පූර්ණයෙන් නතර කිරීමට හැකි වූවා යැයි කියා සතුරා සිතන්නට ඇත. නමුත් දෙවියන්වහන්සේගේ බලය මේ සියල්ලටම ඉහළින්ම තිබෙන බවත් ඔවුන්ගේ නීතියට වඩා බලවත් බවත් ඔවුන් සිතුවේ නැත.



***God had a greater plan***

මෙම හෙබ්‍රෙව් ජාතික තරුණයින් තිදෙනා මේ ආකාරයට ඔවුන්ගේ අත් සියල්ලම බැඳ ඔවුන්ගේ නිදහස නැති කළ විටදී දෙවියන් වහන්සේ එම මොහොතේදී ක්‍රියා නොකළාය කියා යක්ෂයා සතුටු වන්නට ඇත. දෙවියන් වහන්සේ අපගේ යාච්ඤාවන්ට ක්ෂණිකවම උත්තර දෙයි කියා සිතා අපද යාච්ඤා කරමු. නමුත් සමහර අවස්ථාවන්වලදී දෙවියන්වහන්සේ අපට උත්තර දෙයි. තවත් සමහරුන් වෙලාවට උන්වහන්සේ නිහඬව සිටී. එසේම තවත් අවස්ථාවන්හිදී එම යාච්ඤාවන්ට පිළිතුරු දීමට බොහෝ කාලයක් ගනියි. එලෙස පිළිතුරු නොමැතිව නිහඬව සිටින විට අපගේ ඇදහිල්ල පවා සෙලවෙයි. අපගේ ඇදහිල්ල අත්හරින්නය කියා යක්ෂයා අපව පොළඹවනු ඇත.

ඔබ ගැන මා නොදනිමි. නමුත් මගේ අත්දැකීම නම්, මා යාච්ඤා කරන විට සමහර දේවල් යහපත් වෙයි. සමහර දේ තවත් උග්‍ර වෙයි. මෙම හෙබ්‍රෙව් සහෝදරයන් දේව බලය තුළ ඇදහිල්ලේ ස්ථිරව සිටි විට ගිනි උදුන 7 වරක් රත් කළේය.

සමහර වෙලාවන්හිදී අපගේ ජීවිතයේත් අමාරු තත්ත්වයන් වලට පත්වන විට 'ස්වාමීනි මේවාට ඉඩ හරින්නේ ඇයි?' කියා අපි අසමු.

ඔව්, දෙවියන් වහන්සේට මෙම තරුණයන්ව ගින්නට දැමීම වැළැක්වීමට පුළුවන්කමක් තිබුණ නමුත් දෙවියන් වහන්සේ ඊට වඩා මහත් දෙයක් කරනු ලැබීය. දෙවියන් වහන්සේට අවශ්‍ය වූයේ ඔවුන්ව ගිනි උදුනට දැමීමයි. ඔවුන්ව ගිනි උදුනට දමන විට දෙවියන්වහන්සේගේ දෑත් දිගුකර ඔවුන්ව ආරක්ෂා කිරීමට ගිනි උදුන තුළ සිටියේය.

මා විශ්වාස කරනවා ඔවුන් එම ගින්නට වැටුණු විට දෙවියන්වහන්සේගේ සදාකාලික දෑතට වැටුන බව, ඔවුන්ට පෙරටුවෙන් දෙවියන් වහන්සේ ගොස් තිබුණි. දෙවියන්වහන්සේ නිතරම අප ඉදිරියෙන් ගමන් කරයි. එය ගින්නක් වෙන්නට පුළුවනි, එය ගිනි මැද වෙන්නට පුළුවනි. උන්වහන්සේ අපව ආරක්ෂා කරයි. ඔබ තනිව නැත. උන්වහන්සේ ඔබව ධෛර්යමත් කිරීමට ඔබ ඉදිරියේ ඔබ සමඟ ගොස් ඔබව රැක ගනියි.

දෙවියන්වහන්සේගේ අනුමැතිය නොමැතිව අපගේ ජීවිතයේ කිසිදු දෙයක් සිදුවන්නේ නැත. සමහර කාලයන් වලදී අප සටන්කාමී ප්‍රශ්න තුළින් ගමන් කරන විට, උන්වහන්සේ අපව ඒ තුළින් යවනු ලබන්නේ අපට හානියක් වන පිණිස නොවේය. නමුත් ඒ තුළින් අප එළියට පැමිණෙන විට උන්වහන්සේ අපව බලවත් සාක්ෂිකාරයෙන් ලෙස අපව තබයි. එබැවින් අප ඇදහිල්ලෙන් ස්ථිරව සිට ගනිමු.

## 2). නිදහසේ ඇවිදීම !

මෙම තරුණයින් තිදෙනාම ඇවිලෙන ගිනි උඳුනට දැමූ විට ඔවුන්ගේ බැමි සියල්ලම ගැලවී වැටුණි. ඔවුන් දෙවියන්වහන්සේගේ අභිමුඛත්ව තුළින් කිසිදු බාධාවකින් තොරව සිටියෝය. ඔවුන් නිදහසේ එම ගිනි උඳුන තුළ ඇවිදිමින් සිටියෝය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාද ඔවුන් සමඟ ඇවිද්දෝය.



*Four men loose, walking in the midst of the fire*

***''...... අන්න, මනුෂ්‍යයන් සතර දෙනෙක් නිදහස්ව කිසි උපද්‍රවයක් නැතිව ගින්න මැද ඇවිදිනවා මට පෙනෙයි......'' (දානියෙ.ල් 3:25)***

ඔවුන් නිදහසේ කිසිදු උපද්‍රවයක් නැතිව ඇවිද්ද බව දේව වචනය තුළ සඳහන් කරයි. මේ තරුණයින් තිදෙනාව විනාශ කිරීමට ඔවුන් උත්සාහ කළ නමුත් ඔවුන් මහත් ප්‍රීතියෙන් හා නිදහස්කමින් ගිනි මැදගමන් කළේය.

ප්‍රිය සහෝදරයා සහෝදරිය ඔබගේ ජීවිතයද ගිනි මැද සිටින්නට පුළුවන. නමුත් ඔබ දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය තුළ සිටිනවා නම්, ඔබට නිදහසේ සිටින්නට හැකිය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ලේ කරන කොට ගෙන අපට මුළුමනින්ම නිදහස ලැබී තිබේ.

ඔබ අවසාන ලෙස නිදහසේ ප්‍රශ්න මැදින් ගමන් කරනු ලැබූයේ කවදාද? මනුෂ්‍යයන් තමාගේ ගෙවත්තේ සහ උද්‍යානවල ඉතා නිදහසෙන් ඇවිදිනු ලබයි. කිසිම පීඩාවකින් තොරව නිදහසේ ඔවුන් ඇවිදියි.

ශද්‍රක්, මේෂාක් සහ අබෙද්නෙගෝ කිසිම ප්‍රශ්නයකින් තොරව ගිනි මැදින් ඇවිද ආකාරය ඔබට සිතාගැනීමට පුලුවන්ද? සතුරා මෙම තරුණයින්ව පරාජයට පත් කළා කියා සිතුවේය. නමුත් දෙවියන් වහන්සේ බලසම්පන්නව ඔවුන් සමග සිට ඔවුන්ව නිදහස් කරයි කියා යක්ෂයා සිතුවේ නැත.

දෙවියන්වහන්සේ අප ඉදිරියෙන්ද අප සමගද අප පසුපසින් ද සිටින දෙවියන්වහන්සේ ය.

## 3). කිසිදු හානියක් නොමැත!

මෙම තරුණයන් තිදෙනාගේම අත් කකුල් බැඳ තිබූ බැඳුම් පමණක්ම ලිහුනා පමණක් නොව ඔවුන් දෙවියන්වහන්සේ සමඟ ඇවිදිමින් සිටියෝය. එසේම ඔවුන්ට කිසිම හානියක් වී තිබුණේ නැත. ***දානියෙල් 3:25 පවසන පරිදි ඔවුන් කිසිම හානියකින් තොරව කිසි උපද්‍රවය කින් තොරව ඔවුන් ඇවිද්දාය කියා පවසයි.***

එයින් පවසන්නේ ගින්නෙන් ඔවුන්ට කිසිම බලපෑමක් තිබුණේ නැත කියාත් ගිනි ගඳ ඔවුන්ට වැදිලාවත් නැති බවත් දුටුවෝය.

දෙවියන්වහන්සේ ඔවුන්ව සම්පූර්ණයෙන්ම ආවරණය කළ නිසා ඔවුන් ගීතාවලිය 23 ගායනා කරන්නට ඇත කියා මා සිතමි.

***''එසේය මරණ සෙවණේ මිටියාවත මැදින් යන්නෙන් නමුත් කිසි උපද්‍රවයකට බය නොවන්නෙමි. මක්නිසාද ඔබ මා සමගය " (ගීතාවලිය 23:4)***



*Yea, though I walk through the valley of the shadow of death, I will fear no evil!*

සැබවින්ම ස්වාමීන්වහන්සේ ඔවුන් සමඟ සිටියෝය. උන්වහන්සේ පොරොන්දු වූ පරිදි අපව නිදහස් කරමින් සනසන සේක මා උන්වහන්සේගේ අනර්ඝ පොරොන්දු කීපයක් ඔබට ඉදිරිපත් කරමි;

***''.......මක්නිසාද නුඹලාට අත ගසන්නා උන්වහන්සේගේ ඇසේ කළු ඉංගිරියාවට අත ගසන්නේය." (සෙකරියා 2:8)***

***''.....බලව මම මාගේ අතුල්වල නුඹ කොටා ගතිමි .......'' (යෙසායා 49:16)***

....Contd. to page 6




## ඉතා හදිසි දැනුම් දීමක්!

අපගේ ලිපිනය:
**ECHO OF HIS CALL,**
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: sam@echoofhiscall.org

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිදු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**සැප්:19 -** අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ විදුහල්පති, ගුරුවරු සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් නිසා ස්තුති කරන්න.

**සැප්:20-** අපගේ සහකාර කර්තෘවරුන් සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**සැප්:21 -** අපගේ තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව සහ දේව ධර්මාචාර්යය පාඩම් මාලාවට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**සැප්:22-** අපගේ සේවකයින්ගේ පවුල්වලට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය වගුරුවා තිබෙන නිසා ස්තුති කරන්න.

**සැප්:23 -** අපගේ යාච්ඤා හවුල්කරුවන්, දායක හවුල්කරුවන්, ඇදහිල්ලේ හවුල්කරුවන්, ජීවිත කාලය පුරා හවුල්කරුවන් මහා ආඥාවේ හවුල්කරුවන් සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**සැප්:24-** අගෝස්තු මාසය පුරාවටම දෙවියන් වහන්සේ අපගේ අවශ්‍යතාවයන් සැපයීමට විශ්වාසවන්තව සිටි නිසා ස්තුති කරන්න.

**සැප්: 25-** 2025 වන වර්ෂයේ අගෝස්තු 10 වන දින කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ 57 වන වර්ෂයට පිවිසීමට සූදානම් වන විට දෙවියන් වහන්සේගේ මහත් කරුණාවෙන් අපට ලැබුණු නිසා ස්තුති කරන්න.

**සැප්:26-** ශාන්ත පාවුළු මෙට්ට්‍රිකියුලේෂන් පාසලේ නව සිසුන් ඇතුළත් කිරීමට දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ලැබුණු නිසා ස්තුති කරන්න.

**සැප්:27-** අපගේ ප්‍රධාන සභාවේ සහ සියලුම ශාඛා සභාවන්වල ඉරුදින පැවැත් වූ දේව මෙහෙයන්වලදී දෙවියන් වහන්සේගේ වචනයේ බලය ප්‍රකාශ වූ නිසා ස්තුති කරන්න

**සැප්:28-** සන්ධ්‍යා කාලයේ පවත්වනු ලබන අපගේ නෙහෙමියා බයිබල් විදුහලට නවක ශිෂ්‍යයෙන් ගෙන ආ නිසා ස්තුති කරන්න

**සැප්:29-** අපගේ ශුභාරංචි සේවකයින් ඔවුන්ගේ සේවයට දක්වන ඉමහත් කැපවීම නිසා ස්තුති කරන්න.

**සැප්:30-** අපගේ ප්‍රධාන දේවගැති තුමා සහ විවිධ සේවාවන් හරහා සුභාරංචිය ඉදිරියට ගෙනයාම සඳහා ඔහුගෙන් ලැබෙන්නා වූ නොමද කැපවීම නිසා ස්තුති කරන්න.

**ඔක්:01-** අපගේ මුද්‍රණාලය හරහා භාෂා 16කින් අපගේ සඟරාව මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීම සහ ඒවා සේවයේ අවශ්‍ය ස්ථානවලට යැවීමට අපට හැකියාව ලබාදුන් නිසා ස්තුති කරන්න.

**ඔක්:02-** You Tube නාලිකාව හරහා කැඳවීමේ ප්‍රතිරාවය සේවයෙන් විකාශනය වන විනාඩි 5ක පණිවිඩය තුළින් ලැබුණා වූ දිරිගැන්වීම් නිසා ස්තුති කරන්න.

**ඔක්:03-** ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසල, නෙහෙමියා බයිබල් විදුහල සහ තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාවට දෙවියන් වහන්සේගේ අඛණ්ඩ ආශිර්වාදය ලැබුණ නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ඔක්:04:** නිතිපතා දේව ධර්මීය සම්මන්ත්‍රණ පැවැත්වීමට අපට දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම ලැබෙන පිණිස යාච්ඤා කරන්න

**ඔක්:05-** සියලුම ජාතීන් අතර එකමුතුකම සහ සාමය ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:06-** අපගේ සහකාර කර්තෘවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කරන පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:07-** අපගේ සේවයේ හවුල්කරුවන්, රාජ්‍ය සම්බන්ධීකාරකවරුන් සහ ඔවුන්ගේ පවුල්වලට දෙවියන් වහන්සේගේ කරුණාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:08-** ලොව පුරා සිටින ජනතාවගේ ආරක්ෂාව සහ යහ පැවැත්ම ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:09-** ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේශන් පාසලට (ගමේ උසස් පාසල) නව සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:10-** අපගේ ශුභාරංචි පත්‍රිකා මුද්‍රණාලයට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:11-** අපගේ ප්‍රධාන දේව ගැති එස්. සැම් සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ සියලු දෙනටම යහපත් සෞඛ්‍යයක් ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:12-** දෙවියන් වහන්සේ සමග ඇති සම්බන්ධතාවය තුළින් සියලු ජාතීන් හා ඇදහිලිවන්තයින් අතර යහපත් සම්බන්ධතාවයක් ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:13-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ තරුණයින් හා ප්‍රජා සම්බන්ධතා සේවාවන් නිසා යාච්ඤා කරන්න.

**ඔක්:14-** ලෝකයේ විවිධ රටවල් වල තිබෙන ආර්ථික අවපාතයන් අවසන් වන පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:15 -** ලොව පුරා සිටින මිෂනාරී සේවකයින්ට දිව්‍ය ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:16--** අදෙවියන්වහන්සේ විසින් මෙහෙයවනු ලබන දේව බය ඇති නායකයින් සෑම ජාතීන් අතරින්ම බිහිවන පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:17--** ලෝකයේ බොහෝ රටවල පැතිරී තිබෙන වසංගත රෝග සහ නොයෙකුත් ශාරීරික රෝගයන්ට ගොදුරුව සිටින සියලු දෙනාටම සුවය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:18--** ලොව පුරා සිටින සියලුම තරුණ තරුණියන් සහ දරුවන්ගේ ජීවිත දෙවියන්වහන්සේ ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

*''මක්නිසාද නුඹේ සියලු මාර්ගවලදී නුඹ ආරක්ෂා කරන පිණිස උන්වහන්සේ සුවකීය දූතයන්ට නුඹ ගැන අණ දෙන සේක." (ගීතාවලිය 91:11)*

*'ස්වාමීන්වහන්සේ සියලු නපුරෙන් නුඹ ආරක්ෂා කරන සේක. නුඹේ ප්‍රාණය ආරක්ෂා කරන සේක." (ගීතාවලිය 121:7)*

*'මම ඔවුන්ට සදාකාල ජීවනය දෙමි. ඔවුහු කිසි කලකත් විනාශ නොවන්නෝය, කිසිවෙක් මාගේ අතින් ඔවුන් උදුරා නොගන්නේය." (යොහාන් 10:28)*

ප්‍රිය මිත්‍රවරුනි, වර්තමානයේ දී ඔබට තිබෙන ප්‍රශ්න කොතරම් බරපතළ වූවත් ඔබට එයින් කිසිම හානියක් නොමැතිව පිටතට පැමිණෙනු ඇත. ඔබ උන්වහන්සේව ස්ථිර ලෙස අල්ලාගෙන සිටින්න. ඔබට මාර්ගයක් නොපෙනෙන අවස්ථාවේදී උන්වහන්සේ ඔබට මාර්ගයක් විවෘත කරන සේක.

සමහර අවස්ථාවන්වලදී ඔබ ආර්ථික අර්බුද තුළින් යනවා ඇත. නැතිනම් සෞඛ්‍යමය අතින් දුර්වලව රෝගීව සිටිනවා ඇත. නීතිමය පැත්තෙන් ඔබට බාධාවන් තිබෙනවා ඇත. එලෙසම ඔබගේ ප්‍රේමවන්තයින් නැතිවීමෙන් ඔබ අසහනයට පත්ව සිටිනවා ඇත. නමුත් මතක තබාගන්න, ඔබ පසු පසින් ස්වාමීන් වහන්සේ සිටින සේක.

උන්වහන්සේගේ පොරොන්දු විශ්වාස කරමින් ප්‍රකාශ කරන්න. ඔබගේ කුණාටු මැද උන්වහන්සේට ප්‍රශංසා ගී කියන්න. උන්වහන්සේ ඒ සෑම දේ තුළින් ඔබව කිසිම හානියක් නොමැතිව පිටතට ගෙනෙනු ඇත.

මෙම හෙබ්‍රෙව් තරුණියන් තිදෙනා ගින්නෙන් කිසිම හානියක් නොමැතිව පිටතට ආවාක් මෙන්, උන්වහන්සේ ඔබවත් ඔබගේ සියලුම ප්‍රශ්නකාරී අවස්ථාවන් වලින් පිටතට ගෙනෙනු ඇත.

## 4). ගින්නට කිසිදු බලයක් තිබුණේ නැත !

දානියෙල් 3:27 හී මෙසේ පවසයි. *'....ගින්න ඔවුන් කෙරෙහි බල නොපැවැත්වුවේය.....''*

එනම්; ඔබ සිටින තත්ත්වය කුමන ආකාරව තිබුනත් එම ප්‍රශ්න ඔබගේ ජීවිතය කෙරෙහි බලපාන්නේ නැත. හාලේලූයා!

රජතුමා සහ ඔවුන්ගේ සියලු නිලධාරීන්ගේ විශ්වාසය වූයේ ගින්න ඔවුන්ව විනාශ කරයි කියාය. නමුත් සිදු වූයේ ඉතාම අනර්ඝ දෙයකි. දෙවියන් වහන්සේගේ බලය කරනකොට ගෙන උන්වහන්සේ මේ හෙබ්‍රෙව් මනුෂ්‍යයන්ගේ ප්‍රශ්නකාරී තත්ත්වය මුළුමනින්ම නිදහස් කරනු ලැබුවේය.

මා ඔබට මෙය පැවසීමට කැමැත්තෙමි. එනම්; ඔබට තිබෙන සෑම ප්‍රශ්නයන් හමුවේ ඔබ බලාපොරොත්තු රහිතව සිටී නම් ඔබ උන්වහන්සේ තුළ ස්ථිරව සිටින්න. මන්ද උන්වහන්සේ ඔබව මුළුමනින්ම නිදහස් කරයි.

ඔබ තුළ තිබෙන භය, වේදනාව යන අවස්ථාවන් වලට ඉඩ නොදී සම්පූර්ණයෙන්ම ඔබව දෙවියන් වහන්සේට භාර කරමින් දේව දරුවෙක් ලෙස උන්වහන්සේගේ ආධිපත්‍යය ඔබ පාවිච්චි කළ යුතුය. ගින්නක් සැබෑවක් වීමට පුළුවනි. නමුත් එහි බලය ඔබට විරුද්ධව පැමිණෙන්නේ නැත. මෙම තරුණයන් තිදෙනා සමග හතරවෙනි පුද්ගලයෙක් සිටි ලෙස ඔබත් සමගද ස්වාමීන් වහන්සේ සිටින බව විශ්වාස කරන්න.

## 5). දෙවියන් වහන්සේට මහිමය ගෙන ආ සේක!

අපගේ ජීවිතයේ සෑම අවස්ථාවන්හිදීම එනම්; ප්‍රීතිමත් දෙයක් වීමට හෝ එය වේදනාකාරී දෙයක් වීමට පුළුවනි. එය දිව්‍යමය දෙයක් වීමට පුළුවනි. අවසානයේදී එය දෙවියන් වහන්සේගේ නාමයට මහිමය ගෙන දෙන සේක.

ඔව්, ඔබගේ වේදනාව ඔබට අහිමි වූ දේවල් නැතිනම් ගිනිමය අවස්ථාවන් වීමට පුළුවනි. ඒ සෑම දේ මැද හාස්කමන් තුළින් ඔබවද දෙවියන් වහන්සේ මහිමයට පැමිණ වීමට හැකිය. නෙබුකත්නෙශර් රජතුමා මෙම තරුණියන් ගින්නෙන් එළියට පැමිණි හාස්කම දුටු විට ඔහු මෙසේ ප්‍රකාශ කළේය;



*King Nebuchadnezzar's command*

*''ෂද්‍රක්ගේද මේෂක්ගේද අබෙද්නෙගෝගේද දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා! මක්නිසාද උන්වහන්සේ ස්වකීය දූතයා එවා තමන් වහන්සේ කෙරෙහි විශ්වාස කළාවූ තමුන්ගේ දෙවියන් වහන්සේට මිසක් වෙන කිසිම දෙවි කෙනෙකුට සේවයටවත් නමස්කාර කරන්ටවත් නොයෙදෙනාම පිණිස රජුගේ වචනය කඩ කරන්න තමුන්ගේ ශරීරය භාර දුන්නා වූ ස්වකීය මෙහෙකරුවන් ගැලවූසේක. එබැවින් ෂද්‍රක්ගේද මේගේද අබේද්නෙගෝද දෙවියන් වහන්සේට විරුද්ධව දෝෂ කියන සියලු සෙනඟද ජාතීන්ද භාෂාවන්ද කැබෙලිකොට, ඔවුන්ගේ ගෙවල් කසළ*

....Contd. to page 8

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

Pray for

REACHING NATIONS

**NEHEMIAH BIBLE COLLEGES,**

Chepauk & Santhoshapuram, Velachery Chennai.

Qualification : 10th Standard & above

**Rush for admission!** Medium :Tamil (Part Time)
Hindi (Residential) (Sponsorship Available)

**Diploma in Theology**

Recognised by
International Christian Leaders &
Senior Pastors for the past 55 years

**Contact : The Chairman, Nehemiah Bible College.**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**''...කියවන්නා තේරුම් ගනීවා....''** *(මතෙව් 24:15)*

## යටහත් පහත් සේවය ස්වාමීන්වහන්සේ උසස් කරන සේක!

මගේ සේවය ආරම්භයේදී ස්වාමීන් වහන්සේගේ සුභාරංචිය කුමන ආකාරයකින් හෝ සෑම කෙනාටම ප්‍රකාශ කෙරමින් ඔවුන්ව ක්‍රිස්තුස් වහන්සේ තුළින් ගැලවීමට ගෙන ඒමට මහත් වූ උත්සාහයක් සහ බරක් මගේ හදවතෙහි තිබුණි.

(1 කොරින්ති 9:22) දිනක් මා යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය ගැන අඩුම වශයෙන් දිනකට පුද්ගලයෙක් සමගවත් බෙදා ගැනීමට ඕනේ කියා මා තීරණය කළෙමි. මේ තීරණය අද දවස දක්වාම මා ක්‍රියාත්මක කරමින් එක්කෙනෙකුට හෝ දෙවියන් වහන්සේ ගැන ප්‍රකාශ කරමි.

1971 වන වර්ෂයේ මා තමිල්නාඩුවේදී රජයේ කියාවක් කළෙමි. එම කාලයේදී මා සෑම දෙනාටම සුභාරංචි පත්‍රිකා බෙදා දීම මගේ පුරුද්දක් ලෙස තබාගෙන සිටියෙමි. මා රැකියාව නිමවීම නැවත නිවසට පැමිණෙන විට මා මේ සේවය කළෙමි. ඒ කාලය තුළ දහස් ගණන් සෙනගට ශුභාරංචිය දීමට ස්වාමීන් වහන්සේ මට උපකාර කළා පමණක් නොව මේ නිසා ඇති හඳුනාගැනීම් කරණ කොටෙනාට වෙන්නෙයි නුවර සභාවක් ආරම්භ කිරීමට හැකි විය. මගේ සේවයේ සඳහා බොහෝ පත්‍රිකා අවශ්‍ය වූ නිසා ඒවා මුද්‍රණයකර නොමිලයේ බෙදා දීමට මා බොහෝ මුද්‍රණාල වෙත ගිය නමුත් ඔවුන් එයට එතරම් ප්‍රතිචාරයක් දැක්වුවේ නැත. එහෙත් මට මුද්‍රණය කර ගැනීමට හැකි පත්‍රිකා ප්‍රමාණය රැගෙන එය බෙදා දීමට පටන් ගත්තෙමි.

මෙම පත්‍රිකා ලබාගත් බොහෝ සෙනග මා හට පහර දුන්නේය. මෙම සේවය ඉදිරියටම කරගෙන ඒමට උන්වහන්සේ මට උපකාර කළේය. වර්තමානයේදී ත් මා උන්වහන්සේට විශ්වාසවන්තව සේවය කළ අතර උන්වහන්සේ මගේ යටහත් පහත් සේවයට ගරු කළේය.

මෙලෙස මා ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ සේවය කරන කොට ගෙන දෙවියන් වහන්සේ මා හට බලවත් ලෙස ආශිර්වාද කරමින් බොහෝ අයගෙන් යුත් කාර්යය මණ්ඩලයක් සහ නවීන තාක්ෂණය සහිත මුද්‍රණාලයක්ද ගොඩනැගිල්ද අද මා හට දී තිබේ. ඔබ දන්නා පරිදි මෙම සඟරාව පවා ලෝකයේ විවිධ රටවල් වලට භාෂා 16 කින් නිකුත් කර යවමු. උදාහරණ ලෙස; ඉංග්‍රීසි, දෙමළ, මලයාලම්, තෙලිඟු, හින්දි, මරාටි, කන්නඩා, බෙංගාලි, ගුජරාති, ඔරියා, අසාම්, පන්ජාබි, උර්දු, නේපාලි සිංහල සහ ඇෆ්රිකානාස් භාෂාවන්වලින් අපි නිකුත් කරමු. තවද අප ප්‍රධාන සභාවේ ඉංග්‍රීසි, දෙමළ, මලයාලම්, තෙළිඟු සහ හින්දි භාෂාවන්වලින් දේව මෙහෙයන් 5ක් ද පවත්වමු.

***යේසුස්වහන්සේට ඔබගේ ජීවිතයේ මහත් වූ දේ කිරීමට පුළුවනි.*** (ගීතාවලිය 126:3)

***''කඳුළු සහිතව වපුරන්නෝ ප්‍රීතියෙන්ම කපන්නෝය.'' (ගීතාවලිය 126:5)***

*************

....Contd. from page 6

***ගොඩක් කරන හැටියට නියමයක් කරමි. මක්නිසාද මේ ආකාරයෙන් ගළවා ගන්ට පුළුවන් වූ වෙන දෙවිකෙනෙක් නැතැයි කීවේය." (දානියෙල් 3:28- 29)***

දෙවියන් වහන්සේ ගින්නට ඉඩ දෙයි. එනම්; දෙවියන්වහන්සේ දැනුවත්ව අපගේ ජීවිතයට ගින්න එවන්නේ ඇයි?

පළමුව, උන්වහන්සේ ඔබ ගිනි මැද ඇදහිල්ලෙන් ගමන් කරයි කියා විශ්වාස කරයි.

දෙවනුව, ඔබ ගින්න තුළින් පිටතට පැමිණි කල ඔබගේ සාක්ෂිය කරණකොට ගෙන දෙවියන් වහන්සේගේ නාමය මහිමයට ගෙන ඒමට එය පාවිච්චි කරනු ඇත.

එනම් ඔබ ධෛර්යමත් වෙන්න. මාගේ සහෝදර සහෝදරිය ඔබ දැනටමත් මුහුණදෙන්නා වූ සෑම තත්ත්වයක්ම දෙවියන් වහන්සේගේ නාමයට මහිමය ගෙන දෙනු ඇත. ඔබ ගින්නෙන් පිටතට එන විට බලවත් භාජනයක් ලෙස බැබලෙනවා ඇත.

## 6). උසස් කිරීම!

සමහර අවස්ථාවන්වලදී අප අපගෙන්ම අසන ප්‍රශ්නය නම්; ''සෑම දේ තුළ දෙවියන් වහන්සේට පමණක්ම සියලුම ගෞරවය හා මහිමය පුද කරනවා නම්, දෙවියන්වහන්සේ පමණක්ම උසස් වෙනවා නම් මට ලැබෙන්නේ කුමක්ද?" කියාය.

නමුත් දානියෙල් 3 වන පරිච්ඡේදයෙහි ඉතිරි කොටස අප කියවන විට දෙවියන් වහන්සේ උන්වහන්සේව විශ්වාස කළා වූ එම තරුණයන් තිදෙනාට උන්වහන්සේ විපාක දුන්නේ කෙසේදැයි කියා සඳහන් කර ඇත. ෂද්‍රක්, මේෂක් සහා අබෙද් නෙගෝ ආත්මික ලෙස උසස් වීම පමණක් නොව මේ පොළවේ උසස් වීමද ඔවුන් ලැබුවේය.

*''එකල ෂද්‍රක් ද මේෂක්ද අබෙද් නෙගෝද බබිලෝනි පළාතෙහි උත්තමයන් කෙළේය.'' (දානියෙල් 3:30)*

යක්ෂයා ඔවුන්ගේ විනාශය සැලසුම් කළේය:

නුමුත් දෙවියන් වහන්සේ ඔවුන්ගේ උසස් වීම සැලසුම්කළේය. දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ අපව උසස් කරන ආකාරයෙන්ම අප අපගේ ඇදහිල්ල තුල ස්ථිරව හා ධෛර්යමත්ව සිටින විට මේ ලෝකයේදීම අපට උසස්වීම ලැබෙනු ඇත.

යක්ෂයාගේ සැලැස්ම දෙවියන් වහන්සේ වෙනස් කරමින් උන්වහන්සේගේ බලය අප තුළ ප්‍රකාශ කරයි. බලන්න, මේ ගින්නෙන් සිදුවූයේ කුමක්ද කියා,

එය දෙවියන් වහන්සේගේ සැලැස්ම සම්පූර්ණ කළේය. දෙවියන්වහන්සේගේ නාමයට ගෞරවය ගෙන ආවේය. මෙහිදී ඔවුන්ගේ ඇදහිල්ල වර්ධනය වූවා පමණක් නොව ඔවුන්ව ධෛර්යමත් වීමද සිදු කළේය. අනෙක් යුදෙව්වන්ටද ඔවුන්ගේ ඇදහිල්ලෙහි ශක්තිමත් වන්නට හැකි විය. යුදෙව් නොවන අනෙකුත් ජාතිනුත් රජතුමාත් යන සියලු දෙනා ඉදිරියේම දෙවියන් වහන්සේගේ නාමය මහිමයට පත් වූයේය. මෙම තරුණ ජීවිත එතැනින් නතර වූයේ නැත. මෙම ගින්නේ අත්දැකීමෙන් පසුව ඔවුන්ගේ ජීවිතයට අලුත් ආරම්භයක්, අලුත් අරමුණක්, අලුත් දර්ශනයක් හා අලුත් ස්ථානයක් ඔවුන්ට ලබා දුන්නේය. ***මෙයින් ඔප්පු වන්නේ සතුරා අපට නපුර කිරීමට තැත් කරන විට, දෙවියන් වහන්සේ එය අපගේ යහපතට පෙරලෙන බවයි.*** (උත්පත්ති 50:20)

වරක් මෙම රන් රූපයට නමස්කාර කරන්නය කියා පැවසූ රජතුමා ප්‍රසිද්ධියේම මෙලෙස ප්‍රකාශ කරනු ලැබුවේය. එනම්;

***''ඉශ්‍රායෙල්හි දෙවියන් වහන්සේ මෙන් දෙවි කෙනෙක් නැත. මේ ආකාරයෙන් ගලවා ගැනීමට හැකි වෙන දෙවි කෙනෙක්ද නැත.'' (දානියෙල් 3:29)***

## 7). ඔබගේ උද්යෝගීකම උරුමයක් තබා යයි!

අවසානයේදී මෙම හෙබ්‍රෙව් තරුණයින් තිදෙනා ඉතාම බලවත් ස්ථිර උරුමයක් තබා ගියේය. එනම්; නොසැලෙන්නා වූ ඇදහිල්ල ඔවුන්ගේ උරුමය විය. එම නිසා 2025 වන වර්ෂයේදීත් අපි ඒ ගැන කතා කරමු.

දෙවියන්වහන්සේ මොවුන්ට ගිනි මැදින් යාමට ඉඩ සැලසුවේය. උන්වහන්සේ එසේ කරනු ලැබූයේ ඔවුන්ගේ සාක්ෂිය පරම්පරාවෙන් පරම්පරාවට අන් අයට අභියෝගයක් ඇති කරන පිණිසත් දෙවියන් වහන්සේ තුළ ජ්වලිතකම ඇතිව සිටින පිණිසත් හා බලවත් උරුමයක් තබන පිනිසත්ය.

### ඔවුන් නිර්භීතව ප්‍රකාශ කළේය:

***''ඇවිලෙන ගිනි උදුනෙන් ගලවන්ට නම් අප සේවය කරන අපේ දෙවියන් වහන්සේට පුළුවන; රජ්ජුරුවෙනි, උන්වහන්සේ ඔබගේ අතින් අප ගලවන සේක. එසේ නොකළත්, රජ්ජුරුවෙනි, ඔබගේ දෙවිවරුන්ට අප සේවය කරන්නේවත් ඔබ පිහිටුවා තිබෙන රන් රූපයට නමස්කාර කරන්නේවත් නැති බව ඔබ දැනගත මැනව.'' (දානියෙල් 3:17-18)***

දෙවියන් වහන්සේ කෙරෙහි ඔවුන්ට තිබූ ජ්වලිතය දෙස බලන්න. ඔවුන් ඔවුන්ගේ ඇදහිල්ල අත්නොහැර මරණයට පවා මුහුණ දීමට සූදානම් විය. අප ගමන් කරන මාර්ගයේ අප බලාපොරොත්තු වන දේ සිදු නොවන විටදී අප කී වරක් අධෛර්යයට පත් වෙනවාද ? මෙම තිදෙනාම ඔවුන්ගේ ඇදහිල්ල තුළ ස්ථිරව සිටීම පමණක් නොව එය අපගේ ඇදහිල්ලට බලවත් සාක්ෂියක්ද වෙයි.

### මා ඔබගෙන් යමක් අසමි:

ඔබගේ සියලුම පරාජිත අවස්ථාවන්වලදී ඔබට දෙවියන්වහන්සේට සේවය කිරීමට පුළුවන්ද? ඔබගේ රෝගී තත්ත්වයේදී, ඔබගේ පවුලේ තිබෙන ගැටුම් වලදී, ඔබට ශාරීරිකව තිබෙන රෝගී තත්ත්වයන් වලදී, ඔබට තිබෙන ආතති තුළදී හා ඔබගේ පුද්ගලික අපහසුතාවයන්වලදී , ඔබට දිගින් දිගටම ඇතිවෙන්නා වූ කලකිරීම්වලදී හා ඔබ කැඩුණු බිඳුනු අවස්ථාවන්වලදී යන මේ සෑම අවස්ථා වන්හිදීම ඔබට තවමත් දෙවියන් වහන්සේට සේවයක් කිරීමට පුළුවන්ද?

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

**NOTICE**

Please store the Mobile Phone numbers (+91) 98410 71858, (+91) 98412 71858 of Pastor S. Sam Selva Raj on your mobile phones. - Editor

**Don't turn back.**



***He is near, and His arms are open***

උන්වහන්සේගේ දෑත් ඔබ කෙරෙහි දිගු කරමින් සිටියි! එයට පිටු නොපාන්න!

උන්වහන්සේ ඔබ උදෙසා බලා සිටියි. යේසුස්වහන්සේ කුරුසිපත් වූයේ ඒ නිසාය. උන්වහන්සේ අපව හොඳින් තේරුම් ගෙන තිබේ. උන්වහන්සේ අපගෙන් ඈත්ව නොව අපත් සමඟ අප අසලින්ම සිටි සිටියි.

*උන්වහන්සේව තදින් අල්ලා ගන්න. ජුවලිත කමින් සේවය කරන්න.*

**තවත් පරම්පරාවකට කිසියම් උරුමයක් තබා යන්න.**

************

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
on 2nd **SEPTEMBER 2025.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**